සන්නස
SANNASA

# දහඅට වංගුව



## පිහිකාරයෝ සහ හීන් නූල්කාරයෝ

ගිය මාසේ ලිව්ල්ල මගඇරුණා අම්බානක වැඩ නිසා. ලියන්න නම් දේ එමටයි. ඒත් කෝ වෙලාවක්. අමාරුවෙන් හරි ලියන්නම ඕනෙ කාරණා දෙක තුනක්ම සිදුවුණා නිසා මේ සැරේ ලියමු. "දහඅට වංගුව" කියවන පිරිස කොයිතරම්ද කියල තේරුම් ගන්න පුලුවන් වුණා නොලිව්ව මාසේ ආව විමසීම් වලින්. ඒ ජනප්‍රියකම දරාගෙන ඉන්න බැරි පොරක් ප්‍රසිද්ධියේ ඇඳුම් ගලවන හැටිත් චූටි මල්ලි බලා හිටියා ශාලාවක ඈත කෙළවරකට වෙලා. ඒ සූත්තර පුංචා පෙන්නපු කුහක කම මාරයි. පොර කවුද කියලා සබාව තේරුම් ගත්ත එක ගැන චූටි මල්ලිට වඩාත් සතුටුයි. කෙනෙක් කට වහගෙන ඉන්න තාක් කල් මෝඩ කම හංගගෙන ඉන්න පුලුවන් කියලා කතාවකුත් තියෙනවනෙ.

මේ පාර ලියන්න හිතපු කතා වලින් දෙකක්ම ඩේන්ජරස් කේස්. පිහි කේස්. අපි නම් ඉතින් පිහි ගන්නේ කපන්නයි ලියන්නයි විතරයිනෙ. ඒ පිහියම අනින්න කොටන්න බස්සන්න පාවිච්චි කරන බුවාල මෙහෙත් ඉන්න බව දැක්කෙ ටීවී එකෙන්. මෙල්බන් නගරයේ අර දෙනෝදාහක් ගැවසෙන තැනකදි පොලිසියේ දෙන්නෙකුට පිහියෙන් කොටන්න හදපු කෙනා ගැන තමයි මේ කියන්නෙ. ඇනගන්න බැරි වුණාට මිනිහා පැන පැන කෙටුවා. ඒ අතරේ අහිංසකයෙක් පරිප්පුව කෑවා. මේ වෙලාවෙ මෙල්බන් පොලිසියේ ප්‍රතිචාරය හරි ළාමකයි වගේ අපට පෙනුනෙ. ඒ වගේ වෙලාවට කරන්න ඕනෙ දේ ගැන අපේ ලංකාවෙ පොලිසියෙන් අහගන්න ඕනෙ. කොහොම වුණත් ආසියාතිකයන් වැඩි පිරිසකගෙ මතය වුණේ පොලිසිය ඔයිට වඩා තද විය යුතු බවයි. පොලිසියෙ දෙන්නෙකුත් හිටපු එකේ අඩුම ගානෙ අහළ පහලින් පොල්ලක් වත් හොයාගෙන අරූට නෙළන්න තිබ්බ නේද කියල අහපු අයත් හිටියා. ඒත් බොහෝ අය නොදන්න දේ තමයි පොලිසිය මේ වගේ අවස්ථා වලදි ක්‍රියා කරන්නෙ එයාලට දීල තියෙන බලය අවම විදිහට පාවිච්චි කළ යුතුය කියන නියෝගය මතය කියන එක. ඉතින් මොන තත්වයෙදි වුණත් බැරිම අවස්ථාව වෙනකල් ඔවුන් අවම බලය තමයි පාවිච්චි කරන්නෙ. කවුරු කොහොම කීවත් පොලිසිය වගේ මිනිසුන් එක්ක නිතර ගැටෙන ආයතන වලට ඔය දීලා තියෙන බලය හොඳටම ප්‍රමාණවත්. ඕක වැඩි කළොත් මාර ලෙඩක්. ඊට පස්සෙ ඔය ඔල්මොරෙන්දම් කාරයන්ට එරෙහිව පාවිච්ච කරන බලයම තමයි සාදාරණ මහජන නැගිටීම් වලට එරෙහිව පාවිච්චි කරන්නෙත්. ඒවා අපි හොඳට අත්විඳලා තියෙනවනෙ. ඒ නිසා මේ විදිහ හොඳයි.

අනිත් කාරණේ ඒ අව් අස්සෙ අර ෂොපිං ට්‍රොලියක් තල්ලුකරගෙන පොලීසියේ දෙන්නව බේරගන්න හදපු පොර. පස්සෙ බලනකොට මිනිහ පොලිසියට අවශ්‍ය වෙලා හොය හොයා හිටිය මිනිහෙක්ලුනෙ. පිස්සු පීකුදු. හදිසි අවස්තාවලදි මිනිස්සුන්ගෙ හිත ක්‍රියාකරන හැටි. තමන් අවුලේ ඉන්න එකත් මිනිහට අමතක වුණා. බැස්සා ගේමට. අන්තිමේ නතර වුණේ පොලිස් කූඩුවෙ. හිනාත් යනවා ලොක්කා මේවට.

පහුගිය දවස්වල ලංකාවේ වුණ ළමා පිහි කේස් එක චූටි මල්ලිටත් ෂොක් එකක්. ළමයෙක් මහ දවාලේ දෙනෝ දාහක් ඉස්සරහා තවත් ළමයෙකුට එලෝ එලෝ කොටනවා. මිනිසුන්ට වගේ වගක් නැහැ. කිසි කෙනෙක් මැදිහත් වෙන්නෙ නැහැ. හැබැයි සිද්ධිය වෙන්නෙ මාතර දකුණේ සිංහ පොරවල් ඉන්න පළාතේ. සිද්ධියට මුල් වුණ කාරණේ ගැන ලියන්න යන්නෙ නැහැ. හැමෝම ඒක දන්න නිසා. අපට දුක අපේ රට මෙහෙ තත්වෙකට වැටුණ එක ගැන. හැම දෙනාම බලන්නෙ ඇඟ බේරාගෙන ජීවත් වෙන්න. තමන්ගෙ දේකට ඇරෙන්න වෙනත් දේවලට කවුරුවත් මැදිහත් වෙන්නෙ නැහැ. හුදකලා මිනිස්සු වෙලා. අපි මෙහේ ඉඳන් මොන බයිලාව කිව්වත් ලංකාවේ වැඩ සිද්ධවෙන්නෙ අමුතුම ක්‍රමයකට. එක අතකින් බැලුවම දොස් කියන්නත් බැහැ. වලියකට අත දැම්මොත් පොලීසි යන්න වෙනවා. උසාවි යන්නත් වෙනවා. අනික් නොදන්නා වලි වලට පැටලුනාම ඒවා කෙහෙන් කෙළවර වෙයිද කියලා විස්වාසයකුත් නැහැ. ප්‍රශ්න එන්නෙ පැටව් ගහගෙන. ඉතින් ලේසිම වැඩේ නොදැක්කා ගාණට පාවෙලා යන එක. ඒත් ඉතින් ලොක්කා අර මොණරාගල පැත්තේ කෙල්ලෙක්ව පාරේ බිම දාගෙන බෙල්ල මිරිකගා මරණකොට මොන හිතකින්ද ඒක වීඩියෝ කරන්නෙ? මොන මිනිස්සුද අපි? මිනිසුන්ට මේ තරම් ආත්මාර්ථකාමී වෙන්න පුලුවන්ද?

බලාගෙන යනකොට තමන් හැංගිලා ඉන්න වරෙන්තු කාරයෙක්ය කියන එකත් අමතක කරලා පොලිසියෙ දෙන්නා බේරගන්න පැනපු මිනිහා අපේ මිනිස්සුන්ට වඩා කොයි තරම් ඉහළින්ද ඉන්නෙ.

මෙතන මොකක් හරි අවුලක් තියෙනවා ලොක්කා. ලෝකෙන් උතුම්ම රටට ගිය කල ...

## මයික් ටයිසන්ලා

මිත්‍රවරුනි අර මයික් පාල සේන නැත්නම් මයික් ටයිසන් කියලා ලංකාවේ දී හඳුන්වපු කට්ටිය මතකනේ.? මතක නැත්නම් අර සභාවක දී අතට මයික් එකක් දුන්නම සභාවේදී ආපහු ගන්න බැරි කට්ටිය. ඒක පොඩි ලෙඩක් නේ. අනේ මෙහෙම හිටියට මෙහෙදී නැහැ කියලා හිතුවට අම්මෝ නියම සේනලා මෙහෙත් ඉන්නවා. අනේ මොකට ද කියලා හිතුවට බලා ඉන්නම බැරි නිසා ඒ ගොල්ලෝ ගැනත් ලියන්න හිතුනා ආයිබෝං.

මිනිස්සු මොකක් හරි ලැස්ති කරලා ආරාධිතයන්ට වෙලාවක් හේම නියම කරලා සභාව අමතන්න දෙන්නේ පුංචි පිළිවෙලකට.



පළපුරුදු කථිකයො තමන්ට වෙන් කරළා තියෙන කාලසීමාව අනුව තමන්ගෙ කතාව හදා ගන්නවා. ඒත් සභාවක කතා කරන එක ගැන මෙලෝ අන්දෝ සංසාරයක් නැති බාවාලා වැඩේට එන්ටර් වෙලා තමන්ට බාර දීපු සබ්ජෙට් එක ගැන කථා නොකර රටේම තියෙන දේවල් ගැන වරු ගණන් දෙසා බාන්න ගියහම ආපු අයයි සංවිධායකයෝයි සේරම අනාථ වෙන එක අහන්නත් දෙයක් ද?

චුටි මල්ලිත් ඔහොම තැන් කීපයකදීම ඔය පරිප්පුව කලා තියෙනවා. මේ ඊයේ පෙරේදත් එහෙම එකක් උනා. විනාඩි පහළොවක් කතා කරන්න දුන්නම පොරක් නෙළුවා කලාව සාහිත්‍ය, ස්ලෝක, ගාථා, සිංහල, ඉංග්‍රීසි, සංස්කෘත, දෙමළ වගේ රටේම තියෙන දේවල් ගැන වරුවක්. හැබැයි මාතෘකාවට අදාලව නම් විනාඩි දෙක තුනයි. කට්ටියට පිස්සු හැදිලා හිටියේ. සංවිධායකයෝ අනාතවෙලා මූණෙන් මූණ බලාතන්නවා චූටි මල්ලි දැක්කා.

මේ පඬි රුවන භාෂාව ගැන කියපු නිසා චුටි මල්ලී හිතුව මෙහෙම ලියන්න. අපිට තේරෙන විදිහට නම් භාෂාවත් සංස්කෘතිය වගේම එක තැන රැඳෙන එකක් නොවෙයි. ඒක වෙනස්වෙමින් නවීකරණය වෙමින් ඉදිරියට යන එකක්. එකේ වටිනාකම් මතුවෙන්නේ පාවිච්චි කරන අවස්ථාව හා අරමුණු එක්කයි. භාෂාවකට අලුත් වචන අලුත් යෙදුම් එකතුවෙන එක වළක්වන්න කාටවත් බැහැ. අලුත් වදන වල යෙදුම් වල අර්ථය දැනෙන්නේ ඒව පාවිච්චි කරන මිනිස්සුන්ගේ සිතිවිලි හා හැගීම් එක්ක.

වචන තියෙන්නේ හරඹ කරන්න තමයි. අපට දැනෙන විදිහට ප්‍රශ්නේ තියෙන්නේ වචන වල නෙමෙයි. ඒවා පාවිච්චි කරන එවුන්ගේ කැත හිත්වල. දැන් "පට්ට" කියන වචනේ ආවොත් ඇයි මොකද්ද ප්‍රශ්නේ? නියම කියන්නේ ඒකටම තමයි. බහුශ්‍රැතයන් " පට්ට" නොකියයි. ඒත් සාමාන්‍ය ජනයා ඒක භාවිතා කරාවි. අවුලක් නෑනේ. කැමැති කෙනෙකුට හැමදාම ''යටගිය දවස බරණැස නුවර එක් කෙලෙස් පුත්‍රයෙක් වීදියේ සංචාරය කරන කල්හි'' කියලා කිය කියා ඉන්නත් පුළුවනි. ඒ අපි නම් ''ඉස්සර පොරක් බරණැස පාරේ යනකොට'' කියලා කියන්න කැමතියි. ඒ ඒ බනිසේ හැටියටනේ ඒ ඒ කෙසෙල් ගෙඩි දෙන්නේ ලොක්කා. ඒක නිසා තම තමන්ගේ කුහක කම් ප්‍රදර්ශනය කරන්නෙ නැතිව අර ප්‍රේම් ලියලා ෆ්‍රෙඩී කිව්ව වගේ අනුන්ගේ වැඩ ගැන හොයන්නේ නැතුව තමන් දන්න සාස්තරේ කරන් ඉන්නවනම් කොච්චර අගේද සනීපෙට හවසට දෙකක් දගෙන සොලෝකයකුත් කියලා නේ....

"නොදන්න දීගෙට ගිහින් වරිගෙ නහගන්නවා" කියලා කතාවකුත් ඔය අස්සේ චූටි මල්ලිට මතක් වෙනවා.

## මේකත් මැච් එකක්



ඇයි මේ කට්ටිය විස්සෝප වෙලා ලංකාවේ වෙන්නේ මොකද කියලා මේ තරම් උනන්දුවෙන් රේඩියෝ එකෙන් ඔඩ එකෙත් අන්තර්ජාලෙත් හොයන්නේ අම්මපා හරියට ශ්‍රී ලංකාව වන්ඩේ මැච් එකක් ගහන කොට සැරින් සැරේ ස්කෝර් එක බලනවා වගේ. ස නිවුස් බලනවා ෑ නිවුස් බලනවා ගොසිප් පිටුව බලනවා. දැන් මහින්ද කීයද රනිල් කීයද 100 පැනලද තාම 113ක් නැද්ද මාර ආතල් එකක්නේ බොලේ මේ. පිස්සු පීකදු වෙනවා ලොක්කා අපි තරම් ලෝකෙට ආතල් දෙන ජාතියක් තවත් ඇද්ද? මොන මඟුල කරන්න ගියත් ඇන ගන්නවා. තුන්පලේම ගා ගන්නවා. හැමදාම කරන්නේ මේ තුන්ලෝකෙම එවුන් නොකරන වැඩමයි. ලැජ්ජාවේ මැරෙන්න හිතෙනවා.

ලංකාවේ දැන් තියෙන තත්වය ගැන චූටි මල්ලිගේ අදහස මෙහෙමයි. අවුරුදු තුනහමාරක් රටක් පාලනය කරළු යූඑන්පී ප්‍රමුඛ ආණ්ඩුවට තමන්ගේය කියා පත්තරයක් ටීවී එකක් රේඩියෝ එකක් පොලිසියක් හමුදාවක් ගොඩ නගා ගැනීමට නොහැකිවී තිබීමත් ඒ නිසාම මොන ජාත්‍යන්තර සහය ලැබුණත් අධිකරණ තීන්දු ලැබුණත් කිසිත් කරකියා ගැනීමට නොහැකි වී සිටීම නිසාත්

අවුරුදු තුනහමාරක් තිස්සේ තිබුණ ආන්ඩුවට මෙලෝ වැඩක් හරියාකාරව කරන්නට ඉඩ නොදී වර්ජන කරමින් ජඩ මාධ්‍ය භාවිතාවක යෙදෙමින් රජය හා ජනතාව අතර සම්බන්ධය බිඳ දමමින් රජයේ සියලුම

49 වන පිටට